සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## ඉතිහාසය

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02යි.**

<u>I කොටස</u>

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු වරහන් තුලින් තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසය ඉගෙනීමට උපකාරී වන පැරණි පොත් පත් ආදී ලියන ලද දේ ..........................................................මූලාශ්‍රයට අයත් වේ.( සාහිත්‍ය / පුරා විද්‍යාත්මක)

(02) බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ ............................................................................ සිදු වූ දින සිට ය.
( බුදුන් වහන්සේගේ උපත්තිය / මහා පරිනිර්වාණය)

(03) මහා වංශයේ මුල් කොටස රචනා කළේ ............................................................ හිමියන් විසින් ය.
( මහානාම / බුද්ධ ඝෝෂ )

(04) පෘතුවියේ මුලින් ම ජීවීන් හට ගත්තේ............................................................ ය.
( ජලයේ / ගොඩබිමේ )

(05) මිනිසෙකු බිහි වීමට නැඹුරුවක් ඇති පැරණිතම මානවයා ......................................... යන නමින් හඳුන්වයි.
( ඕස්ට්‍රලෝපිතිකස් / හෝමෝ හැබිලිස්)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✓) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුල යොදන්න.

(06) ගොඩබිමේ මුලින්ම පහළ වුයේ පාද කිහිපයක් සහිත හැකරැල්ලන් වැනි සතුන් ය. ( )

(07) වානර පරම්පරාවකින් මානව පරම්පරාවක් බිහි වීම සිදු වන්නේ මහාහිම යුගයේදී ය. ( )

(08) වී වගාව මුල් වරට ආරම්භ වුයේ මධ්‍යම මෙක්සිකෝවේ ය. ( )

(09) පළමු වරට රබර් බෝලය සාදන ලද්දේ මායා ශිෂ්ටාචාරයේ වැසියන් විසිනි. ( )

(10) කූන්‍ය අක්ෂර වලින් වීර කතාවක් ලියන ලද ගිල්ගමේෂ් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පැවති සමයේ ජීවත් වුවෙකි. ( )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන් සඳහා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(11) මහා හිම යුගයේ සිදු වූ වැදගත්ම සිදු වීම කුමක් ද?

(1) මැමත් අලි ගහනය වැඩි වීම. (2) මිනිසා බිහි වීම.

(3) ධාන්‍ය වගාව ආරම්භ වීම. (4) චිම්පන්සි නම් වානරයා බිහිවීම.

LIVEWORKSHEETS

(12) වර්තමානයේ දක්නට ලැබෙන නවීන උපකරණ නිපදවීමට මිනිසාට හැකියාව ලැබුණේ,

(1) ගින්දර සොයා ගැනීම නිසා ය.
(2) සරළ මෙවලම් තැනීම නිසා ය.
(3) කටු මැටි නිවාස තනා ගැනීම නිසා ය.
(4) යකඩ නිපදවා ගැනීම නිසා ය.

(13) පොළොන්නරුවේ ගල් විහාර ප්‍රතිමා නිර්මාණය කළ රජතුමා

(1) පළමුවන පරාක්‍රමබාහු රජතුමා
(2) දෙවන පරාක්‍රමබාහු රජතුමා
(3) නිශ්ශංකමල්ල රජතුමා
(4) දුටුගැමුණු රජතුමා

(14) විජය කුමරු ඇතුළු පිරිස මෙරටට ගොඩබට ස්ථානය ලෙස හැඳින්වෙන්නේ,

(1) මහාතිත්ථ වරාය
(2) දඹකොළ පටුන
(3) තම්බපණ්ණිය
(4) ගෝකණ්ණ තිත්ථ

(15) " මින්නේරි දෙවියන් " නමින් හැඳින් වූයේ,

(1) මහා පරාක්‍රමබාහු රජතුමා
(2) වළගම්බා රජතුමා
(3) වසභ රජතුමා
(4) මහසෙන් රජතුමා

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(16) රුවන්වැලි සෑය ..............................................................රජතුමා විසින් ඉදිකරන ලදී.

(17) මිනිසා බිහි වීමේ ක්‍රියාවලිය .......................................................... නමින් හඳුන්වයි.

(18) .....................................රජතුමා විසින් අභය වැව ඉදි කරන ලද බව මහාවංශයේ සඳහන් වේ.

(19) පණ්ඩුකාභය කුමරු අධ්‍යාපනය ලැබුවේ ............................................ නම් බ්‍රාහ්මණයෙකු ගෙනි.

(20) කට පාඩමින් රැගෙන ආ ත්‍රිපිටකය පොත් වල ලියා තබන ලද්දේ ..................................රජුගේ පාලන කාලය තුල මාතලේ අළුවිහාරයේ දී ය.



LIVEWORKSHEETS